# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2221/56 - 2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2021.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

තරුණ හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39 - (1) වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් විශේෂ විධානය නියම කරමි.

1. 2021 පෙබරවාරි මස 17 දිනැති හා අංක 2215/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* ප්‍රකාරව 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39 (1) වගන්තිය අනුව නිල කාලය දීර්ඝ කරන ලද ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුවේ නිලධරයන්ගේ නිල කාලය 2021 අප්‍රේල් මස 05 වැනි දින අවසන් වේ.

2. 2021 මැයි මස 20 වැනි දින පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය මේ වන විටත් විධිමත් ලෙස පත් කරන ලද නිලවරණ කමිටුව මගින් නියමිත දිනය තුළදී පවත්වන තෙක් සහ අවශ්‍ය පරිපාලනමය සහ අවැසි කටයුතු සිදුකිරීම සඳහා 2021 අප්‍රේල් මස 06 වැනි දින සිට 2021 මැයි මස 20 වැනි දින දක්වා කළමනාකරණ කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන පරිදි පත් කළ තැනැත්තන්ගේ නම් පහත පරිදි බැව් මෙයින් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| i. | මහාචාර්ය අර්ජුන ද සිල්වා | (සභාපති) |
| ii. | ඇෂ්ලි ද සිල්වා මහතා | (ලේකම්) |
| iii. | සුජීව මුදලිගේ මහතා | (භාණ්ඩාගාරික) |
| iv. | නීතිඥ උචිත වික්‍රමසිංහ මහතා | (කමිටු සාමාජික) |
| v. | අමල් එදිරිසූරිය මහතා | (නිරීක්ෂක) |

3. 2021 මැයි මස 20 වැනි දින දක්වා සැලසුම් කර ඇති සංවර්ධන කාර්යයන් සඳහා පමණක් වන වියදම් සහ අත්‍යාවශ්‍ය පරිපාලනමය වියදම් හැර වෙනත් කිසිදු වියදමක් දැරීමට උක්ත කමිටුවට බලය නොමැති අතර එවැනි යම් අවශ්‍යතාවයක් වේ නම් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු බවට මෙයින් නියම කරමි.

**නාමල් රාජපක්ෂ (පා.ම.),**
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2021 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දී ය.